## අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම පද්ධතිය

## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

2024.09.13 දින අනුමත කරන ලදි.

මෙම විශ්විවිද්‍යාලයීය අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් සිසුන්ට, ආචාර්යවරුන්ට සහ අනෙකුත් පාර්ශ්වයන්ට පරිපාලන සහ පරිපාලනමය සහාය සහ සේවා සැපයීම මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. එසේ සිසුන්ගේ, ආචාර්යවරුන්ගේ සහ සේවා සගයන්ගේ අවශ්‍යතා සහ ගැටලුවලට ප්‍රතිචාර දැක්වීම මගින් විශ්වවිද්‍යාලය තුළ සුබවාදී සහ සහයෝගී පරිසරයක් නිර්මාණය වේ. කඩිනම්, කාර්යක්ෂම සහ ආචාරශීලී සේවාවක් ලබා දීමෙන් ඔවුන් තම කාර්ය විශිෂ්ට ලෙස ඉටු කිරීම සඳහා උත්සාහ කළ යුතු ය. එබැවින්, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මෙම ආචාර ධර්ම පද්ධතිය සකස් කර ඇති අතර, එහි සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් එය අවංකව සහ කැපවීමෙන් අනුගමනය කළ යුතු ය.

**1. වෘත්තීය සාරධර්ම**

1.1. විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ සියලු ක්‍රියාපටිපාටිවලදී වෘත්තීයභාවය සහ සංගතබව ප්‍රදර්ශනය කිරීම සහ විශ්වවිද්‍යාලයේ කීර්ති නාමය ආරක්ෂා කිරීම අනධ්‍යාන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් අපේක්ෂා කෙරේ.

1.2. විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු සෑම කාර්ය මණ්ඩලයක්ම තම රාජකාරි ඵලදායී ලෙස ඉටු කළ යුතු අතර නීතිරීතිවලට අනුකූල විය යුතු ය.

1.3. පවරනු ලබන සෑම කාර්යයක්ම අවශ්‍ය ප්‍රමිතීන්ට අනුව සපුරාලීම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වගකීමකි.

1.4. ආගම, කුලය, දේශපාලන, ආර්ථික, සමාජීය සහ ශාරීරික ලක්ෂණ නොසලකා කාර්ය මණ්ඩලය සහ සිසුන් සමඟ සාධාරණව හා අපක්ෂපාතීව කටයුතු කළ යුතු ය.

1.5. ඔවුන් තම රාජකාරි කටයුතුවලදී සහ වගකීම් දැරීමේදී සදාචාරාත්මක ප්‍රමිතීන්ට සහ විනිවිදභාවයට අනුගත විය යුතු ය.

**2. බලධාරීන් සමඟ කටයුතු කිරීම**

2.1. පරිපාලනයේ ධූරාවලියට ගරු කරමින් එය පවත්වා ගත යුතු ය.

2.2. රාජකාරිවලට අදාළ සියලු කාර්ය සඳහා නිවැරදි ක්‍රමවේද භාවිත කළ යුතු ය.

2.3. තම වෘත්තියභාවයට අදාළ නොවන සංවාදවල යෙදීමෙන්, මාධ්‍ය වෙත නිර්නාමික ලිපි නිකුත් කිරීමෙන් සහ විශ්වවිද්‍යාලයේ කීර්ති නාමයට හානි කළ හැකි වෙනත් ක්‍රම මගින් විශ්වවිද්‍යාල පරිපාලකයින් විවේචනය කිරීමෙන් වැළකිය යුතු ය.

2.4. විශ්වවිද්‍යාලයීය සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ කිසිවකු විශ්වවිද්‍යාලයේ පරිපාලන අධිකාරිය මගින් හැර, වෙනත් ආයතනයක රැකියා සඳහා අයදුම්පතක් යොමු නොකළ යුතු ය.

2.5. බලධාරීන්ගේ පූර්ව අවසරයකින් තොරව තමා වෙත පවරා ඇති වගකීම් අන් අයට පැවරීමට අවසර නැත්තේ ය.

2.6. වෘත්තිය ගරුත්වයට අනුකූලව විශ්වවිද්‍යාලයේ දියුණුව සඳහා බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.

2.7. සියලුම නිල තොරතුරු මාධ්‍ය ප්‍රචාරණය, සම්මුඛ සාකච්ඡා හෝ මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍ය සඳහා යොමු කිරීමේදී මහෝපාධ්‍යායයන් වහන්සේගේ/උපකුලපතිවරයාගේ නිල අවසර ලබාගත යුතු ය.

**3. අධ්‍යයන කාර්ය මණ්ඩලය සමඟ සම්බන්ධතාව**

3.1. අධ්‍යයන කාර්ය මණ්ඩලය සමඟ මිත්‍රශීලී සහ සහයෝගී සබඳතා වර්ධනය කළ යුතු ය.

3.2. විශ්වවිද්‍යාලය සංවර්ධනය සඳහා පීඨවලට අදාළ සේවා හා පරිපාලන සේවා සැපයීම මගින් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් වැදගත් භූමිකාවක් ඉටු කළ යුතු ය.

3.3. කඩිනම්, කාර්යක්ෂම සහ ආචාරශීලී සේවාවක් ලබා දීමෙන් ඔවුන් තම කාර්ය විශිෂ්ට ලෙස සැපයීම සඳහා උත්සාහ කළ යුතු ය.

**4. සගයන් සමඟ සම්බන්ධතාව**

4.1. අධ්‍යයන හා පරිපාලන කටයුතු සහ වෘත්තිය සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම්වලදී සගයන්ට සහයෝගය දැක්විය යුතු ය.

4.2. ඔවුන් තම සගයන් පිළිබඳ කටකතා හෝ වැරදි ආරංචි පතුරුවා හැරීමෙන් වැළැකිය යුතු ය.

4.3. ඔවුන් අනෙකුත් සගයන් ගැන ගෞරවාන්විතව කතා කළ යුතු අතර, විශ්වවිද්‍යාලයේ අභිවෘද්ධිය සඳහා සහාය විය යුතු ය.

4.4. සගයන්ට එරෙහිව තහවුරු නොකළ චෝදනා ඉහළ බලධාරීන්ට ඉදිරිපත් කිරීමෙන් වැළකිය යුතු ය.

4.5. සගයන් පිළිබඳ තොරතුරු ඔහුගේ/ඇයගේ ඍජු අවසරයකින් තොරව කිසියම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට ලබා දීමෙන් වැළකිය යුතු ය.

**5. සිසුන් සමඟ සබඳතා**

5.1. අනධ්‍යාන කාර්ය මණ්ඩලය සිසුන් සමඟ සුහද හා මිත්‍රශීලී සබඳතාවක් පවත්වා ගත යුතු අතර, ඔවුන්ගේ ගැටලු නිරාකරණයට උපකාර කළ යුතු ය.

5.2. අනධ්‍යාන කාර්ය මණ්ඩලය සිසුන්ට පරිපාලන සහාය සහ සේවා ලබාදීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කළ යුතු ය.

5.3. සිසුන් සම්බන්ධ රහස්‍ය තොරතුරු අවසරලත් පාර්ශ්වයන්ට පමණක් ලබා දිය යුතුය.

5.4. අනධ්‍යාන කාර්ය මණ්ඩලය සැමවිට ම සිසුන්ට ගෞරවයෙන් සැලකිය යුතු අතර, අවංකභාවය සහ සාධාරණත්වය යන උතුම් ගුණධර්ම ආරක්ෂා කළ යුතු ය.

**6. විශ්වවිද්‍යාලය තුළ සාමාන්‍ය පැවැත්ම සහ විනය**

6.1. ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ මූල්‍ය රෙගුලාසි, අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විශ්වවිද්‍යාලයීය පනත්, නියෝග, රෙගුලාසි, චක්‍රලේඛ ආදි විධිවිධාන සහ අනෙකුත් උපදෙස්වලට අනුගත වී ඒවාට අනුව කටයුතු කළ යුතු ය.

6.2. බලධාරීන් විසින් කලින් කලට ස්ථාපිත කරනු ලබන ආයතනයේ මූලික හර පද්ධතීන් සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සියලුම අනධ්‍යාන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සාමූහික වගකීමකි.

6.3. අනධ්‍යයන කාර්ය මණ්ඩලය සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ වාර්තා හෝ වෙනත් සංවේදී කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගත යුතු ය.

6.4. විශ්වවිද්‍යාලයීය සේවයේ නියුතු කිසිදු කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට පූර්ව අවසරයකින් තොරව තම රාජකාරියෙන් නිවාඩු ලබාගත නොහැක.

6.5. රෝගී තත්ත්වයක් හෝ වෛද්‍ය හේතුන් මත නොපැමිණීමකදී, විශ්වවිද්‍යාල අධිකාරිය සෑහීමකට පත්වන වෛද්‍ය සහතිකයක් සතියක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

6.6. අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විශ්වවිද්‍යාලයේ පහසුකම්, උපකරණ සහ අරමුදල් ආදි සම්පත් වගකීමෙන් හා ආචාරධර්මවලට ගැළපෙන ආකාරයෙන් භාවිත කළ යුතු ය.

6.7. විශ්වවිද්‍යාලයීය සේවයේ නියුතු කිසිදු කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට රාජකාරි කාලය තුළ කිසිදු දේශපාලන ක්‍රියාකාරකමක නිරත විය නොහැක.

6.8. සේවයේ නියුතු කිසිදු කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය තුළ අසමගිය ඇති කිරීමට හේතු වන කිසියම් ක්‍රියාකාරකමක නිරත වීමට හෝ සහභාගී වීමට අවසර නැත.

6.9. විශ්වවිද්‍යාලයට අයත් මුදල් අයකැමිවරුන්ගෙන් හෝ ඔවුන්ගේ ඕනෑම සහායකයෙකුගෙන් ණයට ගැනීම තහනම් ය.

6.10. අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හට විශ්වවිද්‍යාලයේ රාජකාරි කාලය තුළ අවසරයකින් තොරව විශ්වවිද්‍යාලයෙන් පිටවීම තහනම් ය.

6.11. විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් රාජ්‍ය ආයතන පරිශ්‍රයක් තුළ රාජකාරි කාලය තුළ හෝ ඊට පසුව මත්පැන් හෝ වෙනත් මත්ද්‍රව්‍ය භාවිත කිරීම හෝ ඕනෑම ආකාරයක අල්ලසක් ලබා ගැනීම බරපතල විෂමාචාරයක් ලෙස සැළකේ.

6.12. අනධ්‍යයන කාර්ය මණ්ඩලය නියමිත කාලයට විශ්වවිද්‍යාලයට වාර්තා කළ යුතු අතර, නිතර සේවයට නොපැමිණීමෙන් වැළකිය යුතු ය.

6.13. රාජකාරි කටයුතු සිදු කිරීම සඳහා අවසර නොලත් පුද්ගලයින් යොදා නොගත යුතු ය.

6.14. උපකරණවලට සිදුවී ඇති හානි සහ දෝෂ වාර්තා කළ යුතු ය.

6.15. රාජකාරි කටයුතු සම්බන්ධ තීරණ ගැනීමේදී පෞද්ගලික, දැනහැඳුනුම්භාවය හෝ මූල්‍ය සම්බන්ධතා මත පදනම් වූ පක්ෂපාතීබව මගින් අයුතු බලපෑම්වලට ලක් නොවන බවට සහතික විය යුතු ය.

6.16. කම්කරු ශ්‍රමය සහ විශ්වවිද්‍යාල දේපල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිසිවෙකු විසින් ඔවුන්ගේ පෞද්ගලික ප්‍රතිලාභ සඳහා භාවිත නොකළ යුතු ය.

6.17. මහෝපාධ්‍යායයන් වහන්සේගේ/උපකුලපතිවරයාගේ කවර හෝ අනුමැතියකින් තොරව කුමන හෝ විශ්වවිද්‍යාල අරමුණක් වෙනුවෙන් කාර්ය මණ්ඩලයෙන් හෝ ජනතාවගෙන් අරමුදල් රැස් කිරීම සිදු නොකළ යුතු ය.

6.18. ඍජු හෝ වක්‍ර පෙළඹවීම් මත තනතුරු, උසස්වීම් සහ ස්ථාන මාරු යනාදිය ලබා ගැනීම නීති විරෝධී වේ.

6.19. කාර්ය මණ්ඩලයේ සියලු දෙනා විසින්ම ඔවුන් යෙදී සිටින කාර්යයට අනුබද්ධව අවශ්‍ය වන ආකාරයෙන් ඔවුන්ගේ රාජකාරිය සහ සෞඛ්‍යය මෙන්ම ආරක්ෂණය සහ සනීපාරක්ෂාවට උචිත වන ආකාරයට ඇඳුම් පැළඳුම් භාවිත කළ යුතු ය.

## 7. වෘත්තීය සංවර්ධනය හා පුහුණුව

7.1. අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඔවුන්ගේ රැකියාවලට අදාළ තාක්ෂණික සහ තාක්ෂණික නොවන නිපුණතා සංවර්ධනය කරගැනීමට වැඩි ප්‍රමුඛතාවක් ලබා දෙමින් නිරන්තරයෙන් කටයුතු කළ යුතු ය.

7.2. අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් උසස් අධ්‍යාපනය ලබා ගැනීමට ප්‍රයත්න දැරිය යුතු ය.

7.3. ඔවුන්ගේ රාජකාරි ඵලදායී සහ කාර්යක්ෂමව සිදුකිරීමට කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අවස්ථාව සැලසෙන පරිදි අදාළ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ වඩාත් උචිත භාවිතයන් යාවත්කාලීන කළ යුතු ය.

**8. විෂමාචාර සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය**

8.1. විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ දක්වා ඇති පරිදි විෂමාචාර හැසිරීම් රටාවලට සමගාමීව මෙම ආචාර ධර්ම පද්ධතිය සලකා බැලීම සිදු කළ යුතු ය.

8.2. මෙම ආචාර ධර්ම පද්ධතිය ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය පාලනය කරනු ලබන නීති සහ රෙගුලාසිවලට අනුකූලව අර්ථ නිරූපණය කෙරෙනු ඇත.

8.3. සියලු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් විසින් විශ්වවිද්‍යාලය තුළ සිදුවන්නා වූ කවර හෝ අල්ලස් දීමක්, අක්‍රමිකතා සිදු කිරීමක්, දෝෂ සහගත පරිපාලන ක්‍රියාවක්, මහජන සම්පත්වලට සිදු කරන විශේෂිත නාස්තියක්, මහජන තොරතුරු උල්ලංඝනය කිරීම හෝ වෙනත් කවර හෝ ආකාරයේ විෂමාචාරයක් ගණයට ගැනෙන වැරදි ක්‍රියාවල කවර හෝ අවස්ථාවක් අදාළ බලධාරීන්ට වාර්තා කිරීමට නිත්‍යානුකූලව බැඳී සිටී. විශ්වවිද්‍යාලය විසින් තොරතුරු හෙළිදරව් කරන්නන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කෙරෙනු අතර, මෙකී ගැටලු වාර්තා කිරීමට සුදුසු ඊට උපකාරි වන පසුබිමක් නිර්මාණය කරනු ඇත.

8.4. ඉහත දක්වන ලද කවර හෝ නීති කඩකිරීමක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනය/ආයතනයක ඒ සඳහා වන ආයතන සංග්‍රහයෙහි XVIII සහ XIX යන පරිච්ඡේදවල විශේෂ කොට දක්වා ඇති විනය ක්‍රියාමාර්ගවලට අනුකූලව උචිත ආකාරයෙන් කටයුතු කරනු ලබනවා ඇත.

- නිමාව -